සබරගමුව පළාත් සභාව - சப்பிரகமுவ மாகாண சபை - Sabaragamuwa Provincial Council

**අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

கல்வி தகவல் தொழில் நுட்பம் மற்றும் கலாசார நடவடிக்கைகளுக்கான அமைச்சு

Ministry Of Education, Information Technology & Cultural Affairs

Email||:edusabaram@gmail.com Facebook||:SabEducationMinistry

| මගේ අංකය<br>எனது இல<br>My Number | ME/E/2 (සබර/චක්‍රලේඛ) | ඔබේ අංකය<br>உமது இல<br>Your Numbe | දිනය<br>திகதி<br>Date | 2014.03. 13 |
|---|---|---|---|---|

**<u>පළාත් අධ්‍යාපන චක්‍රලේඛ අංක</u>**
**<u>: සබර/2014/12</u>**

විදුහල්පති,
ර/කුමර විද්‍යාලය,
නව නගරය,
රත්නපුර.

**<u>5 ශ්‍රේණිය ඉගෙනුම ලැබ 6 ශ්‍රේණිය සඳහා පාසලක් නොලද පිරිමි ළමුන් සඳහා 6 ශ්‍රේණියට අතිරේක පන්තියක් ආරම්භ කිරීම</u>**

ර/පර්ගසන් උසස් විද්‍යාලය,ර/ජේසු බිළින්දාගේ කන්‍යාරාම විද්‍යාලය, ර/සුමනා බාලිකා විද්‍යාලය යන විදුහල්වල 1 – 5 ශ්‍රේණිවල ඉගෙනුම ලැබූ පිරිමි ළමුන් සඳහා 6 ශ්‍රේණියට ඇතුලත්වීමට නිශ්චිත පාසලක් නොමැතිවීම යන කරුණු සම්බන්ධව සලකා බලා එම ළමුන් සඳහා පාසලක් ලබාදීමේ අරමුණින් ර/කුමර විද්‍යාලයේ 6 ශ්‍රේණිය සඳහා නව පන්තියක් මේ වසරේ සිට ආරම්භ කිරීමට සබරගමුව පළාත් අධ්‍යාපන ව්‍යුහ කමිටුව විසින් අනුමත කර ඇත. මේ සඳහා ගරු පළාත් අධ්‍යාපන ඇමතිතුමාගේද එකගතාවය ලැබී ඇත.

02. ඒ අනුව මේ වසරේ සිට ර/කුමර විද්‍යාලයේ 6 ශ්‍රේණිය දැනට පවත්වාගෙන යන පන්ති දෙකට අමතරව නව පංතියක් ආරම්භ කිරීමට කටයුතු කරන ලෙස මින් දන්වා සිටිමි. එම පන්තිය සඳහා ළමුන් බඳවා ගැනීමේ ක්‍රම වේදය පහත පරිදි වේ.

* එම පන්තියට බඳවා ගත හැකි උපරිම ළමුන් සංඛ්‍යාව 45කි.

* ර/පර්ගසන් උසස් බාලිකා විද්‍යාලය, /ජේසු බිළින්දාගේ කන්‍යාරාම විද්‍යාලය, ර/සුමනා බාලිකා විද්‍යාලය යන විදුහල්වල විදුහල්පතිවරු විසින් එම පාසල්වල 1 – 5 ශ්‍රේණිවල ඉගෙනුම ලබා 6 ශ්‍රේණියට පාසලක් නොලද පිරිමි ළමුන්ගේ ලිපිනයන් සහිත නාම ලේඛනයක් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙත නොපමාව යොමු කලයුතුය.

* පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශ සහිත සියළු නාම ලේඛන පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කල යුතුය.

* පළාත් අධ්‍යාපන ලේකම් විසින් බඳවා ගතයුතු ළමුන්ගේ නාම ලේඛනය අනුමත කර ර/කුමර විද්‍යාලයේ විදුහල්පති වෙත යොමු කිරීම.

ගරු අමාත්‍යතුමා Hon.Minister Office-045-5623222,045-2287306 Residence-045-2222538 Mobile-077-9102001 Fax-045-2228042

අමාත්‍යංශ ලේකම් Secretary Office-045-2223015 Residence-045-2232985 Mobile-071-4402000 email-msweerasooriya@gmail.com

කාර්යාලය Office නවනගරය,රත්නපුර. Newtown,Rathnapura. Office-045-2222542 Fax-045-2228042

(93)

* මෙම ළමුන් බදවා ගැනීමේදී පාසල්වලට ළමුන්ට ළමුන් ඇතුළත් කිරීමට අදාල චක්‍රලේඛ වල සඳහන් මුදල් අයකිරීම් හැර කිසිදු අතිරේක මුදලක් අය නොකළ යුතුය.

* ඉහත සඳහන් විදුහල්වල පිරිමි ළමුන් ඇතුළත් කර ගැනීමෙන් පසුව එම අතිරේක පන්තියේ තව දුරටත් ළමුන් ඇතුළත් කර ගැනීමට ඉඩකඩ තිබේ නම්, රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 5 වසර ශිෂ්‍යත්ව විභාගය සමත් ළමුන්ගේ ලකුණු පදනම් කරගෙන ( ලකුණු 70 ට වැඩි) ලකුණු ප්‍රමුඛතාවන් මත පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය මත බදවා ගැනීම් කල හැකිය.

03. මෙම චක්‍රලේඛයේ උපදෙස් තරයේ පිළිපදින ලෙස මින් අවධාරණය කරමි.

Ministry of Provincial Education * Sabaragamuwa *

මහින්ද එස්. වීරසූරිය
ලේකම්
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව
නව නගරය - රත්නපුර.

මහින්ද එස්.වීරසූරිය,
ලේකම්,
අධ්‍යාපන,තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.

පිටපත් 01. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ - දැ.පි. හා අ.ක.ස.
02. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ / රත්නපුර - දැ.පි. හා අ.ක.ස.
03. කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂ / රත්නපුර 1 /11 - දැ.පි. හා අ.ක.ස.
04. විදුහල්පති - ර/පර්ගසන් උසස් බාලිකා විද්‍යාලය.
ර/ජේසු බිළින්දාගේ කන්‍යාරාම විද්‍යාලය.
ර/සුමනා බාලිකා විද්‍යාලය.
05. E/16 , E/17 විෂය ගොනුවට.